# අයදුම්පත්‍ර කැඳවීම

සී/ස බණ්ඩාවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් පිරිස් පුහුණු තනතුර සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනට සමුපකාර සමිතිවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා ගේ නිර්දේශය මත අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

ඔබ විසින් සකස් කරන ලද ඉල්ලුම්පත්‍රයක් නිසි ලෙස සම්පූර්ණ කර පදිංචිය පිළිබඳ සහතිකය, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග 2026.09.31 දිනට පෙර ගරු සභාපති, සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, අංක 04, පෙරේරා මාවත, බණ්ඩාරවෙල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුරු නාමය හා වැටුප් පරිමාණ අංකය සඳහන් කළ යුතුය.

| | | |
|---|---|---|
| තනතුර | : | **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් / පිරිස් හා පුහුණු)** |
| වැටුප් පරිමාණ අංකය | : | SM 1-2026 |
| බඳවා ගැනීමේ ශ්‍රේණිය | : | 111 ශ්‍රේණිය |
| වැටුප් පරිමාණය | : | 49,000 - 500 x 7 - 560 x 9 - 630 x 11 - 700 x 12 - 72,870<br>(මීට අමතරව දීරි දීමනාද හිමිවේ) |
| වයස් සීමාව | : | අවුරුදු 21 – 45 |

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණ / ව්‍යාපාර කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම

හා

පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම

හා

පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක මානව සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 01 කට නොඅඩු සේවා පළපුරුද්ද

හෝ

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම

හා

පිළිගත් ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම

හා

පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම

හා

පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක මානව සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්ද

**සාමාන්‍යාධිකාරී,**
**2026.08.18**
**සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අංක 04, පෙරේරා මාවත, බණ්ඩාරවෙල.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED